සිව්සස් හැඳින සැනසුම ලබමු

- **කෙටි පිළිතුරු ලියන්න.**

1. චතුරාර්ය සත්‍යය පිළිවෙළින් නම් කරන්න.
2. බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය පිළිබඳව පැහැදිලි කරමින් සිදුකළ මංගල ධර්මදේශනාවෙහි නම කුමක් ද?
3. ක්ලේශ ධර්මයන් අතර මූලික වන තණ්හාව මංගල ධර්ම දේශනාවේ දී බෙදා දක්වා ඇති කොටස් තුන නම් කරන්න.
4. දුක්ඛ නිරෝධය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?
5. ජාති, ජරා, ව්‍යාධි ආදී සියලු දුකට හේතුව බුදු දහමෙහි දක්වා ඇත්තේ කුමන නමකින් ද?
6. දුකින් මිදීම සඳහා බැහැර කළ යුතු අන්තගාමී පිළිවෙත් දෙක නම් කරන්න.
7. දුක්ඛ ආර්ය සත්‍යයෙහි දුක බෙදා ඇති කොටස් තුන නම් කරන්න.
8. ත්‍රිශික්ෂාව නම් කරන්න.
9. බුදුරජාණන් වහන්සේ දුක්ඛ ආර්ය සත්‍යයෙහි දක්වා ඇති එදිනෙදා ජීවිතයේ දී අනිත්‍යතාව පදනම් කරගෙන මුහුණ පෑමට සිදුවන දුක්ඛයන් මොනවාද?
10. සම්මා වාචාවට අයත් වැළකිය යුතු වචනයෙන් සිදුවන අකුසල් හතර නම් කරන්න.

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. චතුරාර්ය සත්‍ය කෙටියෙන් හඳුන්වන්න.
2. ත්‍රිවිධ තණ්හාව කෙටියෙන් පැහැදිලි කරන්න.
3. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිවිධ ශික්ෂාවට අනුව බෙදා දක්වන්න.
4. ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් කරුණු වෙන වෙනම පැහැදිලි කරන්න. උදා :-සම්මා දිට්ඨි යනු චතුරාර්ය සත්‍ය පිළිබඳ ඥානය යි.
5. ඔබට මුහුණ දීමට සිදුවන ගැටලුවක් නම් කර එය විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යයෙන් ලබා ගත හැකි ආදර්ශය පෙන්වා දෙන්න.
6. **යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ .....**යනුවෙන් පෙල පොතෙහි සඳහන් ගාථාව සරල තෙරුම සහිතව කටපාඩම් කරන්න.